# සමාජ විද්‍යා තරඟාවලිය - 2023

## 8 ශ්‍රේණිය

කාලය :- පැය. 01 මිනි.30

පාසල:...................................................... නම:............................................................

✶ 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. මින්නේරිය දෙවියන් වශයෙන් ජනතාව අතර ප්‍රසිද්ධ රජතුමා කවුරුන් ද?
i) මහා පරාක්‍රමබාහු රජතුමා ii) මහසෙන් රජතුමා
iii) ධාතුසේන රජතුමා iv) වසභ රජතුමා

02. සෞරග්‍රහ මණ්ඩලයේ අභ්‍යන්තර ග්‍රහලෝකවලට අයත් ග්‍රහලෝකය කුමක් ද?
i) සිකුරු ii) සෙනසුරු
iii) යුරේනස් iv) බ්‍රහස්පති

03. බ්‍රිතාන්‍ය පාලන යුගයේ ආරම්භ කළ පොදු සේවාවක් නොවන්නේ,
i) ප්‍රවාහනය ii) අධ්‍යාපනය
iii) තැපැල් හා විදුලි පණිවිඩ සේවා iv) බැංකු සේවා

04, 2023 පෙබරවාරි මස දී රටවල් කිහිපයකට ප්‍රබල හානි ගෙනදුන් භූ කම්පනය ඇති වූ රටවල් වන්නේ,
i) ඉරානය, ඇෆ්ගනිස්ථානය ii) ලෙබනන්, සයිප්‍රස්
iii) සිරියාව, තුර්කිය iv) සිරියාව, ඉරානය

05. ළමා අයිතිවාසිකමක් වන්නේ,
i) හොඳින් අධ්‍යාපන කටයුතුවල නිරත වීම ii) ගුරු දෙගුරුන්ට ගෞරව කිරීම
iii) පාසලේ විනය, නීතිරීති හා සම්ප්‍රදායන් ආරක්ෂා කිරීම iv) අධ්‍යාපනය ලැබීම

✶ 06 සිට 10 දක්වා වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරා ඒ යටින් ඉරක් අඳින්න.

06. වැවක ප්‍රධාන අංගයක් වන රළපනාවෙන් සිදුවන කාර්යය වන්නේ,
i) වැව් බැම්ම හරහා ඇළ මාර්ග වෙතට ජලය යොමු කිරීම
ii) වැව් බැම්ම සේදී යාම වළක්වා ගැනීම
iii) වැවේ අතිරික්ත ජලය බැහැර කිරීම
iv) වෙනත් ජල මූලාශ්‍රයකින් වැවට ජලය සැපයීම

07. රතු ග්‍රහයා නමින් හැඳින්වෙන ග්‍රහලෝකය කුමක් ද?
i) අඟහරු ii) සිකුරු iii) සෙනසුරු iv) බ්‍රහස්පති

08. සමාජ ආරක්ෂණ ජාල වැඩසටහනක් වන්නේ,
i) ක්ෂය රෝග හා ළය රෝග පිළිබඳ ජාතික වැඩසටහන
ii) ඒඩ්ස් මර්ධන වැඩසටහන
iii) ළදරු හා මාතෘ සායනය
iv) ජ්‍යේෂ්ඨ පුරවැසියන් සඳහා සුභසාධන වැඩසටහන

09. වසන්ත ඍතුවේදී දක්නට ලැබෙන ලක්ෂණයක් නොවන්නේ මින් කුමක් ද?
i) හිම හා අයිසි ක්‍රමයෙන් දියවීම ii) ගස්වල මල් හා ඵල හට ගැනීම
iii) ශාකවල කොළ හැලීම iv) උෂ්ණත්වය ක්‍රමයෙන් ඉහළ යාම

10. ලොව ධනවත් රාජ්‍ය කිහිපයක එකතුවෙන් පවත්වන G7 සමුළුව මෙවර පැවැත්වෙන රට කුමක් ද?
i) එක්සත් ජනපදය ii) ජපානය iii) බ්‍රිතාන්‍ය iv) ඉතාලිය

✶ 11 සිට 15 දක්වා ප්‍රශ්නවල හිස්තැනට ගැළපෙන නිවැරදි පිළිතුර තිත්ඉරි මත ලියන්න.

11. සාහිත්‍ය මූලාශ්‍රවලට අනුව .......................... ලංකාවේ ඉදි වූ මුල් ම දාගැබ වේ.

12. ලෝකය සම්මත වේලා කලාප .................................................. කට බෙදා ඇත.

13. නිදහස් අධ්‍යාපනයේ පියා ........................................................ මහතා ය.

14. "එකා සැමටත් - සැම එකාටත්" යන්න ............................................. ආදර්ශ පාඨය යි.

15. වර්තමානයේ යුක්‍රේනය සමග යුධ ගැටුම් ඇති කරගත් අනෙක් රට ........................................ වේ.

✶ 16 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු ලියා දක්වන්න.

16. මහනුවර යුගයේ චිත්‍රවල වැඩිපුරම දක්නට ලැබෙන වර්ණය කුමක් ද?

17. ශ්‍රී ලංකාවේ 1:50000 පරිමාණයට මෙට්‍රික් සිතියම් පත්‍රිකා කීයකට බෙදා තිබේ ද?

18. ළමා අයිතිවාසිකම් වෙනුවෙන් ක්‍රියාත්මක වන එක්සත් ජාතීන්ගේ ආයතනය කුමක් ද?

19. ජනතාවගේ අදහස් පිළිගැනීම හා ගරු කිරීම දැකිය හැකි නායකත්ව ශෛලිය කුමක් ද?

20. ලොකයේ උසම කඳු මුදුන නම් කරන්න.

✶ අංක 21 සිට 25 දක්වා දී ඇති ප්‍රශ්නවලට 'අ' සහ 'ආ'යනුවෙන් තීරු දෙකක් දැක්වේ. ඒවායේ සම්බන්ධතාවය අනුව නිවැරදිව අකුරු ගළපා ඇති පිළිතුර යටින් ඉරක් අඳින්න.

21. උඩරට කැපී පෙනෙන රජවරු විසින් ඉටු කරන ලද කාර්යය නිවැරදි ව සඳහන් වන්නේ,

| 'අ' | 'ආ' |
|---|---|
| i) පළමුවන විමලධර්මසූරිය රජු | A - දළදා පෙරහැරට දේවාල පෙරහැර එක් කිරීම |
| ii) දෙවන විමලධර්මසූරිය රජු | B - දළදාව උඩරටට වැඩමවා තැන්පත් කිරීම |
| iii) කීර්ති ශ්‍රී රාජසිංහ රජු | C - දළදා මාලිගාවට පත්තිරිප්පුව එක් කිරීම |
| iv) රාජාධිරාජසිංහ රජු | D- බුරුමයෙන් උපසම්පදාව ගෙන්වා උඩරටට උපසම්පදාව පිහිටුවීම |

i) ABCD ii) BADC iii) BDAC iv) ACDB

22. දකුණු ආසියානු කලාපීය භූ දර්ශනය විවිධ වේ. ඒ ඇසුරින් පහත ප්‍රකාශ ගලපන්න

| 'අ' | 'ආ' |
|---|---|
| i) කඳුකර භූ දර්ශනයක් නොමැති රට | A - නේපාලය |
| ii) විශාලම ගංගා නිම්නය | B - ගංගානම් |
| iii) වෙරල තීරයක් නොමැති රට | C - මුම්බායි |
| iv) ජනාකීර්ණ නගරයකි | D - මාලදිවයින |

i) ABDC ii) DBAC iii) DCAB iv) ACBD

23. ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයකි. ඒ අනුව විවිධ ආගම් හා බැඳුණු උත්සව නිවැරදිව දක්වා ඇත්තේ,

| 'අ' | 'ආ' |
|---|---|
| i) බෞද්ධ | A - රාමසාන් |
| ii) හින්දු | B - වෙසක් |
| iii) කතෝලික | C - මහා ශිව රාත්‍රිය |
| iv) ඉස්ලාම් | D - පාස්කු |

i) BADC ii) BCDA iii) BDAC iv) DACB

24.පහත ප්‍රකාශ නිවැරදිව ගලපන්න.

| 'අ' | 'ආ' |
|---|---|
| i) උෂ්ණත්වය අධිකම ග්‍රහලෝකය | A - සිකුරු |
| ii) සූර්යයාට ආසන්නවම පිහිටි ග්‍රහලෝකය | B - පෘථිවිය |
| iii) ජීවීන් වාසය කරන එකම ග්‍රහලෝකය | C - බුධ |
| iv) උපග්‍රහයින් වැඩිම ග්‍රහලෝකය | D - බ්‍රහස්පති |

i) CABD ii) ACBD iii) BCDA iv) BACD

25. පහත සඳහන් සොයාගැනීම් හා නිර්මාණවලට අදාළ පුද්ගලයින් නිවැරදි ව ගලපන්න.

| 'අ' | 'ආ' |
|---|---|
| i) ජොහැන්නස් ගුටෙන්බර්ග් | A - අවසාන විනිශ්චය චිත්‍රය |
| ii) ලියනාඩෝ ඩාවින්චි | B - මුද්‍රණ යන්ත්‍රය |
| iii) විලියම් හාවේ | C - මොනාලිසා චිත්‍රය |
| iv)මයිකල් ආන්පිලෝ | D - මිනිස් සිරුරේ රුධිර සංසරණ පද්ධතිය පිළිබඳ තොරතුරු |

i) CBAD ii) BCDA iii) BACD iv) CABD

✶ අංක 26 සිට 30 තෙක් ප්‍රශ්න සඳහා පිළිතුරු ලියන්න.

26.



i) මෙම රූපයේ දැක්වෙන පුද්ගලයා කවුද?

------------------------------------------------------------

ii) ඔහු විසින් සිදු කළ වැදගත්ම සේවාව කුමක් ද?

------------------------------------------------------------

27. ස්වාභාවික විපත් ඇතිවන ස්වභාවය අනුව ප්‍රධාන කොටස් 02 කි.

i) පෘථිවි අභ්‍යන්තර ක්‍රියාවලීන් නිසා ඇතිවන විපතක් නම් කරන්න.

------------------------------------------------------------

ii) කාලගුණික හා දේශගුණික විපර්යාස නිසා ඇතිවන විපතක් සඳහන් කරන්න.

------------------------------------------------------------

28.



i) මෙම පින්තූරයේ දැක්වෙන්නේ කුමක් ද?

------------------------------------------------------------

ii) මෙම සම්ප්‍රදාය භාවිත වූ රාජ්‍ය සමය කුමක් ද?

------------------------------------------------------------

29.




i) මෙම උපකරණය කුමක් ද?

------------------------------------------------------------

ii) එය සොයාගත් පුද්ගලයා කවුරුන් ද?

------------------------------------------------------------




30. i) සිතියමේ A අක්ෂරයෙන් දැක්වෙන භූ ලක්ෂණය සඳහන් කරන්න.

------------------------------------------------------------

ii) B අක්ෂරයෙන් දැක්වෙන භූ ලක්ෂණය නම් කරන්න.

------------------------------------------------------------

✶ අංක 31 සිට 35 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

31. i) වායු ගෝලය හා ගොඩබිම අතර ජලය චක්‍රීය ව සංසරණය වීමේ ක්‍රියාවලිය හඳුන්වන නම කුමක් ද?

..........................................................................................................

ii) ජලය දූෂණය වීමට බලපාන මානුෂ ක්‍රියාකාරකම් 02 කෙටියෙන් දක්වන්න.

..........................................................................................................

..........................................................................................................

32. i) සීගිරි ජල උද්‍යානය පිළිබඳ ව තොරතුරු අණාවරණය කරගත් ශ්‍රී ලාංකික පුරා විද්‍යාඥයා නම් කරන්න.

..........................................................................................................

ii අතීතයේ ජල උද්‍යානවල කැපී පෙනෙන ලක්ෂණ 02 ලියන්න.

..........................................................................................................

..........................................................................................................

33. i) ශ්‍රී ලංකාව බහු සංස්කෘතික රටකි. වෙනත් බහු සංස්කෘතීන් පවතින රටවල් 02 ක් නම් කරන්න.

..........................................................................................................

ii) බහු සංස්කෘතික සමාජයක අනුගමනය කළ යුතු ගුණාංග 02 සඳහන් කරන්න.

..........................................................................................................

..........................................................................................................

34. i) අභයගිරිය ස්ථූපය ඉදිකළ රජතුමා කවුරුන් ද?

..........................................................................................................

ii) රජරට ශිෂ්ටාචාරය සමයට අයත් වාස්තු විද්‍යා නිර්මාණ බෙදිය හැකි ප්‍රධාන කොටස් 02 කුමක් ද?

..........................................................................................................

..........................................................................................................

35. i) ආපදා මගින් ඇතිවන හා ඇතිවිය හැකි හානි අවම කර ගැනීමේ ක්‍රියාවලිය කුමන නමකින් හඳුන්වයි ද?

..........................................................................................................


ii) ආපදාවක දී අපට සහාය ලබාගත හැකි ආයතන 02 නම් කරන්න.

..........................................................................................................

..........................................................................................................

✶ අංක 36 සිට 40 දක්වා දී ඇති ස්ථාන ශ්‍රී ලංකා ආකෘති සිතියමේ ලකුණු කර නම් කරන්න.

36. ත්‍රිකුණාමලය
37. පේදුරු තුඩුව
38. මාතර
39. මහනුවර
40. සීගිරිය



LOL.lk
**BookStore**

# විභාග ඉලක්ක
# පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න





| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්

pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | T | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**